**මොරටුව විශ්වවිද්‍යාලය - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මොරටුව විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත්මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයට පෙර මිලදී ගත් ප්‍රාග්ධන භාණ්ඩවලට අදාලව රැදවුම් මුදල් රු.2,155,052 ක් හා 2012 සහ 2014 වර්ෂවලදී නිම කරන ලද කොන්ත්‍රාත් 03 ක රැදවුම් මුදල් රු.2,429,936 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | උපදේශන ආයතනයේ හා ඉංජිනේරුවරයාගේ නිර්දේශය ලැබුණු වහාම එම නිර්දේශයට අනුව කටයුතු කරනු ලබන බව. | රඳවාගත් මුදල් ප්‍රමාදයකින් තොරව නිරවුල් කිරීම සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) දෙපාර්තමේන්තු 03 ක ස්වයං මූල්‍ය පාඨමාලාවන් සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණවලට සම්බන්ධ වුවන් සඳහා ගෙවිය යුතු රු.10,584,513ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී ද නිරවුල් කිරිමට අපොහොසත් වී තිබුණි. | තව දුරටත් සොයා බලා අදාල වැය ශීර්ෂය / සංවර්ධන අරමුදල් වලට මාරුකරනු ලබන බව. | යෝග්‍යතා පරීක්ෂණවලට සම්බන්ධ වුවන් නිවැරදිව හඳුනාගෙන ප්‍රමාදයකින් තොරව ගෙවීම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) රජයේ වාහන නඩත්තු කිරීම සම්බන්ධ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව යන කාරණා අතරින් මුලින්ම | 2020, 2021 සහ 2022 යන වර්ෂ වල කොරෝනා වසංගතය හේතුවෙන් හා පවතින රියදුරු පුරප්පාඩුව, ඉන්ධන හිඟය, ඉන්ධන කෝටා ක්‍රමය නිසා ඉන්ධන පරීක්ෂාව නිසි ආකාරව සිදු | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| | යෙදෙන අවස්ථාවේ නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදුකල යුතු වුවත්, විශ්වවිද්‍යාලය සතු වාහන 37 න් වාහන 34 ක් සඳහා එපරිදි කටයුතු කර නොතිබුණි. | කිරීමට නොහැකි විය. දැනට ඉන්ධන පරීක්ෂාව නොකල වාහන වල ඉන්ධන පරීක්ෂාව සිදුකොට ලොග් පොතේ ඊට අදාල දත්ත නිවරදිව සම්පූර්ණ කිරීමට කටයුතු ආරම්භ කර ඇත. | |
| (ආ)රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ඡේදය- | වටිනාකම රු.1,407,600 ක් වූ ශ්‍රවනාගාර පුටු සපයා සවිකිරිමේ ප්‍රසම්පාදනය සඳහා සාර්ථක ලංසුකරු සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | මොරටුව විශ්වවිද්‍යාලය ප්‍රතිපත්තියක් වශයෙන් රු. මිලියන 02 ට වඩා වැඩි සැපයුම් සම්බන්ධයෙන් පමණක් කාර්යසාධන බැදුම්කර ලබා ගැනීම හා ගිවිසුම් අත්සන් කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | | | |
| (i) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන කොමිෂන් සභා චක්‍රලේඛයෙහි 5.1.6 ඡේදය - | විශ්වවිද්‍යාල ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ඉපයූ ආදායමෙන් සියයට 0.01 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත බැර කළ යුතු වුවද 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් උපයන ලද ආදායමෙන් රු.333,238 ක් කොමිෂන් සභාව වෙත බැර කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මේ සඳහා දායකත්වයක් ලබා නොදෙන බැවින් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලද අයවැයන්හි වෙන් කිරීමක් කර නොමැති බව. | කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) 2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයෙහි 4 (ii) ඡේදය - | පොත් 100,001 ට වැඩියෙන් පවතින පුස්තකාලවල අංශ අනුව කරන ලද වාර්ෂික සත්‍යාපනය වර්ෂ 03 කදී අවසන්කල යුතු වුවද පරිග්‍රහන ලේඛනය අනුව පවතින පොත් 114,758 ක් සම්බන්ධයෙන් 2013 වර්ෂයේ සිට වාර්ෂිකව පොත් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2023 වර්ෂයේදී සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව පුස්තකාල පොත් සත්‍යාපනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ පළමුවන ඡේදය | උසස් අධ්‍යාපන ආයතන වල අභ්‍යන්තර විභාග ප්‍රතිඵල විභාග දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුලත නිකුත් කළ යුතු වුවත්,මොරටුව විශ්ව විද්‍යාලය විසින් 2022 වර්ෂය තුල පවත්වන ලද විභාග විභාග 26 ක ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 03 ඉක්මවා මාස 01 සිට අවුරුදු 01 මාස 05ක කාලයක් ප්‍රමාද වී තිබුණි. | නැවත මෙවැනි ගැටළු ඇතිවීම වැලැක්වීමට අදාල පාර්ශව දැනුවත් කිරීමට සහ ප්‍රතිඵල උඩුගත කිරීමේ ක්‍රියාපටිපාටිය ක්‍රමවත් කිරීමට අවශ්‍ය සියළු පියවර මේ වනවිටත් ගෙන ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාදයකින් තොරව ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (iv)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.2,017,672,383 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | මුළු විශ්වවිද්‍යාල පද්ධතිය තුළම සිදුවන්නේ මෙම ක්‍රමවේදය වන බැවින් මොරටුව විශ්වවිද්‍යාලය තුල ද එම ක්‍රමවේදය ක්‍රියාත්මක බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන වගන්තිය සහ 2019 ජුලි 29 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපිය | මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබානොගෙන මූල්‍ය කමිටු නිර්දේශය අනුව සමාලෝචිත වර්ෂය තුළදී රු.902,200,000 ක් ආයෝජන කර තිබුණි. | විශ්වවිද්‍යාලයේ ජංගම ගිණුම්වල පවතින අතිරික්ත මුදල් ශේෂ පදනම් කරගනිමින් ආයෝජනයන් සිදු කරනු ලබන අතර වරින් වර සිදු කරනු ලබන ආයෝජන වලදී මුදල් ආමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම අපහසු වීම හා ඒ සඳහා කාලයක් ගතවන බැවින් මුදල් කමිටු නිර්දේශය හා පාලක සභා අනුමැතිය මත ආයෝජනයන් සිදු කර ඇත. | 1971 අංක 38 දරන මුදල් පනතේ II වන වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.89,099,282ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.170,489,623ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,390,341ක පිරිහීමක් නිරීක්ෂණය විය.මෙම පිරිහීමට පුද්ගල පඩිනඩි වැඩිවීම හා අනෙකුත් මෙහෙයුම් වියදම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

විශ්වවිද්‍යාලයේ සමස්ථ ආදායම ඉකුත් වර්ෂයට වඩා රු.470,329,265 ක් එනම් සියයට10.67ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර සමස්ථ වියදම් රු.551,719,606 කින් එනම් සියයට 13 කින් වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

- <u>ජංගම අනුපාතය</u>

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 2.123 : 1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය 2.017 : 1 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතයේ වාසිදායක තත්ත්වයක් වර්ධනය වී තිබුණි.

- <u>ක්ෂණික අනුපාතය</u>

සමාලෝචිත වර්ෂයේ ක්ෂණික අනුපාතය 2.096 :1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය 1.99 : 1 ක් විය.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගිවිසුම් හා බැඳුම්කර කඩකල ආචාර්යවරුන් 29 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.62,969,142 ක් පැවතුණි. ඒ තුළ වර්ෂ 21 ත් වර්ෂ 30 ත් අතර කාලයක සිට පැවත එන නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.5,074,425 ක් සහ වර්ෂ 31 ත් වර්ෂ 41 ත් අතර කාලයක සිට පැවත එන නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,908,708 ක් පැවතුණි. | වසර 20 කට අධික කාලයක් ගත වූ ආචාර්ය වරුන්ගෙන් පියවා ගැනීමට ඇති මුදලින් යම් ප්‍රමාණයක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකරගෙන ඇති අතර ඇතැම් අයගේ එම මුදල් ද අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට හැකියාව පවතී.<br>වර්තමානය වන විට එම ආචාර්ය වරුන් සම්බන්ධ කර ගෙන එම මුදල් අර්ථ සාධක අරමුදලින් අය කිරීමට තම කැමැත්ත ප්‍රකාශ කරන බවට ලිඛිත සාක්ෂියක් ගෙන්වා ගැනීමට හැකි කිසිදු ක්‍රම වේදයක් ද විශ්වවිද්‍යාලය සතුව නොමැති බව. | ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයවිය යුතු මුදල් අයකර ගැනිම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර අයකර ගැනීම් කඩිනම් කිරීම හා එම අයවීම් කාලීනව පසුවිපරම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාලයේ විවෘත හා දූරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් සම්බන්ධීකරණය කරනු ලබන BIT පාඨමාලාව සඳහා පෞද්ගලික ආයතන සමග එළඹි | මුදල් අය කර ගැනීම සඳහා නීතිමය පියවර ගනිමින් පවතින බව. | අයකරගැනීම කඩිනම් කිරීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| ගිවිසුම්වලට අනුව එක් එක් ආයතනය විසින් බඳවා ගත යුතු අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා නොගැනීම හේතුවෙන් පෞද්ගලික ආයතන දෙකකින් ආයතනයට අය විය යුතු රු. 8,255,000 ක මුදල 2023 ජුලි 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | | |
| (ඇ) මොරටුව විශ්ව විද්‍යාලයේ අධ්‍යයන හා පරිපාලන කාර්යය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත යුනිකන්සල්ටන්සි සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි වී විශ්වවිද්‍යාලය තුල එහි කටයුතු පවත්වාගෙන යනු ලැබුවද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023 ජුලි 31 දින වන විටද ලබා ගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත තොරතුරු යවා ඇති බව. | අදාල අනුමැතීන් ලබාගැනීම කඩිනම් කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති තනතුර බාර ගැනීම සඳහා භූ විද්‍යා අධ්‍යන අංශයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්යවරයෙකු හට පාලක මණ්ඩල අනුමැතිය මත 2017 නොවැම්බර් 21 දින සිට වැටුප් රහිත නිවාඩු ප්‍රදානය කර තිබුණු අතර විශ්වවිද්‍යාල වැටුපම ඔහුට ගෙවීම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක්ද ලබාගෙන තිබුණි. එහෙත් 2018 පෙබරවාරි 14දින රැස්වූ පාලක සභාව විසින් නිලධාරියාගේ ඉල්ලීම පිට 2017 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සප්ත වාර්ෂික නිවාඩු අනුමත කර තිබුණද එහිදී වැඩිවැටුප් ගෙවීමට ලබාගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ගැන හෝ වැටුප් රහිත කාලය සම්බන්ධයෙන් අවධානයක් යොමු නොකිරීම නිසා මෙම නිලධාරියාට විශ්වවිද්‍යාල වැටුප ආයතන දෙකෙන්ම ලබා ගැනීමට හැකිවී තිබුණි. | ආචාර්ය දිසානායක මහතාට 2017.12.01 සිට 2019.11.30දින දක්වා 379 වන නිවාඩු ප්‍රදාන කමිටුව මගින් වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු අනුමත කර ඇති බැවින් අදාළ කාලයට වැටුප් ගෙවා ඇති බව. | නිවාඩු ප්‍රදාන කමිටුව හා පාලක සභාව විසින් සප්ත වාර්ෂික නිවාඩු අනුමත කිරීමේදී රජයට අලාභයක් නොවන ආකාරයට වඩාත් විමර්ශනාත්මකව කටයුතු කල යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ අරමුදල් ගිණුමෙහි රු.10,504,569 ක ශේෂයක් පැවති අතර 2016 වර්ෂයේ සිට ඉන් කිසිදු වියදමක් දරා නොතිබුණි. | මෙම ගිණුමට අදාල වන නිර්ණායක වලට අනුව උපයෝජනය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | අදාළ නිර්ණායක වලට අනුව අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අරමුණු කර ගෙන දීර්ඝ කාලයක සිට අක්‍රීයව පවතින ශිෂ්‍යත්ව අරමුදල්වලින් රු.13,602,546 ක් 2020 හා 2021 වර්ෂ තුළදී සම්මාන සහ ශිෂ්‍යත්ව (Awards & Scholarship Account) නමින් නව අරමුදලකට බැර කර තිබුණ ද ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අවශ්‍යවන්නා වූ නිර්ණායක සකස් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ද මෙම අරමුදල උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | සම්මාන හා ශිෂ්‍යත්ව ගිණුම (Policy on Awards & Scholarship Account) සඳහා වූ ප්‍රතිපත්තිය ඒ සඳහා පත්කල කමිටුව විසින් 2023.01.02 පැවති මුදල් කමිටුවට ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා මුදල් කමිටු නිර්දේශය ලැබී 2023.01.04 දින පැවැති පාලක සභාව විසින් අනුමත කර ඇත. ඒ අනුව ඉදිරියේදී මෙය ශිෂ්‍යත්ව හා සම්මාන ලබා දීමට උපයෝජනය කිරිමට යොදා ගනු ලබන බව. | අදාල නිර්ණායක වලට අනුව ප්‍රමාදයකින් තොරව කාලීනව මෙම සම්මාන සහ ශිෂ්‍යත්ව ලබා දීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල යටතේ ගිණුම් 53 ක රු.179,311,051 ක් ද, පාඨමාලා සංවර්ධන අරමුදල යටතේ ගිණුම් 36 ක රු.72,548,888 ක් ද ඌන උපයෝජිතව පැවතුණි. ඉන් ගිණුම් 18 ක පැවති එකතුව රු.6,040,365 ක් අවුරුදු 06 ක සිට හා ගිණුම් 13ක පැවති එකතුව රු. 9,267,103ක් සමාලෝචිත වර්ෂය තුළදී ද උපයෝජනය කර නොතිබුණි. | මෙම මුදල් ස්වයං ඉපයීම් වන අතර අදාල අංශ ප්‍රධාන විසින් හඳුනාගනු ලබන කාර්යය මණ්ඩල හා ශිෂ්‍ය ක්‍රියාකාරකම්, විද්‍යාගාර හා දෙපාර්තමේන්තු උපකරණ මිලදී ගැනීමට භාවිතා කරනු ලබයි. මෙම අරමුදල් නිශ්චිත කාලයක් තුල වැය කල යුතු බාහිර ආයතනයක් විසින් සපයන ලද අරමුදල් නොවන බැවින් වියදම් නොකර සංචිතයක් ලෙස තබා ගැනීමේ ගැටලුවක් නොමැති බව. | සංවර්ධන අරමුදල් විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යෙදවිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 සිට වර්ෂ 12 අතර කාලයක සිට පවතින එකතුව රු. 25,248,414 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 30 ක් කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමීමකින් තොරව අක්‍රීයව පැවතුණි. | ශිෂ්‍යත්ව අරමුදල් සිසුන් සඳහා ප්‍රදානය කිරීම සඳහා ඒ ඒ ශිෂ්‍යත්ව අරමුදලේ නිර්නායකයන් සපුරා ඇති සිසුන් නොමැති වීම හෝ ප්‍රමාණවත් මුදල් ශේෂ නොමැති වීම නිසා අරමුදල් උපයෝජනය වී නොමැත. කෙසේ වෙතත් මේ පිළබඳව ඉදිරියේ දී සොයා බලා නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. | මෙසේ අක්‍රීය වීම සඳහා බලපාන ප්‍රධාන කරුණු සමාලෝචනය කර ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් පර්චස් 12 ක් වර්ෂ 50 ක කාලයක් සඳහා 2009 ඔක්තෝබර් 14 දින කල්බදු ගිවිසුමක් යටතේ රු.1,400,000 ක පිරිවැයක් දරා බද්දට ගෙන තිබුණි. බදු ගිවිසුම අනුව ඉඩමෙහි සංවර්ධන කාර්යයන් ගිවිසුමේ දින සිට මාස 06 කින් ආරම්භ කර අවුරුදු 02 ක් තුල නිම කිරීමට අපොහොසත් වුවහොත් බදු ගිවිසුම ස්වයංක්‍රීයව අවලංගු වී ඉඩමෙහි සන්තකය බදු හිමියාට අයිති වන බවට වූ කොන්දේසිය විශ්වවිද්‍යාලය විසින් කඩකර තිබීම මත ගිවිසුම ස්වයංක්‍රීයව අවලංගු වී ඇති බවට 2018 පෙබරවාරි 27 දිනැති නාගරික සංවර්ධන අධිකාරි ලිපිය මගින් දැනුම් දී තිබුණි. ඒ අනුව ඉඩම බද්දට ගැනීමට දරන ලද රු.1,400,000 ක මුදල ආර්ථික නොවන වියදමක් වී තිබුණි. | මෙම ඉඩම අවලංගු කිරීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය කැමැත්ත ලබා දීමට දැනුවත් කිරීමක් කර නොමැති බැවින් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ මේ සම්බන්ධයෙන් අවලංගු වීමක් සඳහන් වී නොමැත. එබැවින් මේ සම්බන්ධයෙන් ඉඩමේ බදු ගිවිසුම තව දුරටත් ක්‍රියාත්මක කිරීමට නාගරික සංවර්ධන අධිකාරි සමඟ එකඟතාවයකට පැමිණීමට කටයුතු කරන අතර එසේ නොවුවහොත් හෝ ගෙවා ඇති වියදම් නැවත ලබා ගැනීම සම්බන්ධයෙන් විමසීමේ කටයුතු සිදු කිරීමට මුදල් කමිටු හා පාලක සභා තීරණය කර ඇත. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රතිචාරය අනුව ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | රජයට වඩාත් වාසිදායක වන තීරණ ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) විශ්වවිද්‍යාලයේ පවත්නා පීඨ පුළුල් කිරීම හා නව ව්‍යාපාරික පීඨය ස්ථාපිත කිරීම සඳහා 2016 අගෝස්තු 31 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් භුක්තිය පවරන ලද පිටිපන පිහිටි අක්කර 20 ක ඉඩමෙහි කිසිදු සංවර්ධන කාර්යයක් සිදු නොකිරීම මත 2021 පෙබරවාරි 08 දිනැති අංක 10/8/3289 දරන නාගරික සංවර්ධන අධිකාරී ලිපිය ප්‍රකාරව මෙම ඉඩම වෙනත් සංවර්ධන කාර්යයක් සඳහා ලබාදීමට හඳුනාගෙන ඇති බවත් එය විශ්වවිද්‍යාලයට ලබා දීමට නොහැකි බවත් දැනුම් දී තිබුණි. | මෙම ඉඩම ද නැවත නාගරික සංවර්ධන අධිකාරියට පවරා නොමැති අතර එම ඉඩම විශ්වවිද්‍යාලය විසින් භුක්ති විඳින අතර එම ඉඩමේ පොල් ඵලදාවෙන් ආදායමක් ලබා ගනී. ඉදිරියේ දී මෙම ඉඩම ව්‍යාපෘතියක් සඳහා උපයෝජනය කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | ඉඩමේ නීත්‍යානුකූල හිමිකම පවරා ගෙන අදාල සංවර්ධන කාර්යයන් කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2016 හා 2017 වර්ෂවල පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ ශ්‍රවනාගාරය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු රු.1,407,600 ක් වටිනා ශ්‍රවනාගාර පුටු 60 ක් හා රු.4,948,020 ක් වටිනා හඬ නිරීක්ෂණ කැමරා 2 ක් ඇතුළු උපාංග 2023 ජනවාරි 22 දින වනවිටද සැලසුම් කල ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් නිම නොකිරීම හේතුවෙන් පුස්තකාලය තුළ නිශ්කාර්යව අසුරා තිබුණි. ශ්‍රවනාගාර පුටුවල අවුරුද්දක වගකීම් කාලය හා කැමරාවල අවුරුදු 03 ක වගකීම් කාලය ප්‍රයෝජනයට ගැනීමටත් පෙර ඉකුත් වී තිබුණි. | ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් ප්‍රමාද වී ඇතත් මේ දක්වා පුටු සවිකර නොමැති වුවත් පුස්තකාලයේ රැස්වීම් සහ අවශ්‍යතාවය අනුව අනෙකුත් වැඩසටහන් සඳහා පුස්තකාලය විසින් භාවිතයට ගෙන ඇත. කැමරා උපකරණ සවි කිරීමට ශ්‍රවණාගාරයේ අලුත්වැඩියා කටයුතු නිමකල යුතුය. එතෙක් ඒවා අදාල ස්ථානයන්හි සවිකොට නොමැත. එම කැමරා උපකරණ සවිකර නොමැති වුවද අයිතමයන් වෙන් වෙන් වශයෙන් පුස්තකාලයේ සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පවත්වන ලද වැඩසටහන් සඳහා භාවිතා කරන බව. | සැලසුම් කල ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් කඩිනමින් නිමකර මිලදී ගත් උපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2019 වර්ෂයට පෙර මිලදී ගෙන භාවිතයට නොගෙන ගබඩාවේ තිබුණු රු.2,894,247 ක් වටිනා ටෝනර් සහ කාට්‍රිජ් 346 ක් භාවිතයට ගැනීමේ හැකියාව පරීක්ෂාකර ඉදිරියේදී අවශ්‍ය අංශයන් වෙත නිකුත් කරන බවත් භාවිතයට ගත නොහැකි තොගයන් ඉවත් කර ගිණුම් තුල ගැලපීම් සිදු කරන බවත් ඉකුත් | මෙම ටෝනර් සහ කාට්‍රිජ් අවශ්‍ය අංශ පවතී ද යන්න පිළිබඳ තවදුරටත් සොයා බැලීම් සිදු කොට ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණයන් රඳවා ගනිමින් ඉතිරි තොග සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීමට කටයුතු සිදුකරනු ලබන බව. | අවශ්‍යතාව හඳුනා ගෙන මිලදීගැනීමට කටයුතු කිරීම හා මිලදී ගෙන තිබෙන තොගයන් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂයේදී විගණනයට දැනුම් දී තිබුණද 2023 අප්‍රියෙල් මාසය දක්වාම ඒ සම්බන්ධව කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. | | |
| (ඉ)විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍ය ආපනශාලාව තුළින් බැහැර කරන ආහාර අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් ජීවවායුව නිෂ්පාදනය කර එම වායුව ආපනශාලාවල ආහාර පිසීම සඳහා භාවිතයට ගැනීමේ නියමු ව්‍යාපෘතියක් 2017 පෙබරවාරි 22 දින රු.1,434,319 ක වියදමක් දරා ස්ථාපිත කර තිබුණද, එහි නිපදවන ජීවවායු ප්‍රමාණය ආපනශාලාවේ උදුන් දැල්වීමට ප්‍රමාණවත් නොවන බැවින් එම පද්ධතිය වැඩි දියුණු කිරීමට යෝජනා වී තිබුණි. 2023 ජූලි 30 දින වන විටද එය වැඩිදියුණු කර භාවිතයට නොගැනීම නිසා විශ්වවිද්‍යාලය විසින් දරන ලද රු.1,434,319ක මුදල ආර්ථික නොවන වියදමක් වී නොතිබුණි. | ප්‍රධාන ප්‍රතික්‍රියාකාරකය (Reactor) යාන්ත්‍රික දෝෂයක් හේතුවෙන් ක්‍රියාත්මක කළ නොහැකි මට්ටමක පවතින අතර, පසුගිය කාලයේ දී වෙන් කළ ප්‍රාග්ධන අරමුදල් අඩු බැවින් විකල්ප අරමුදල් ප්‍රභවයක් සුරක්ෂිත වූ වහාම මෙම දෝෂය නිවැරදිකර නියමු බලාගාරය සාමාන්‍ය මෙහෙයුම් තත්ත්වයට ගෙන ඒමට අපේක්ෂිත බව. | ඉදි කිරීම් දෝෂයන් කඩිනමින් නිවැරදි කර උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

## 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයට අතිරේක සිසුන් බඳවා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා බහුකාර්යය ගොඩනැගිල්ලක් ඉංජිනේරු පීඨය තුල ඉදිකිරීමට සැලසුම් කර, මාස 06ක කාලයක් තුල ඉදිකිරීම් නිම කිරීමට රු.159,790,000 ක වටිනා කොන්ත්‍රාත්තුවක් 2014 අගෝස්තු 11 දිනද, ඉහත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව යටතේ නිමනොවූ කාර්යයන් මාස 08 ක කාලයක් තුල නිම කිරීමට රු.153,141,553 ක් වටිනා නව කොන්ත්‍රාත්තුවක් 2020 ඔක්තෝම්බර් 14 දිනද ප්‍රදානය කර තිබුණි. එහෙත් මෙම ඉදිකිරීම් සඳහා අවුරුදු 08 මාස 03 ක කාලයක් ගත කර රු.310,740,961 ක වියදමක් දරා තිබුණද ඉදිකිරීම් නිමකර භාවිතයට ගැනීමට අපොහොසත් වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම් කාර්යයන් සමීප අධීක්ෂණයට ලක්කර කඩිනමින් නිමකරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාස්තු විද්‍යා පීඨයේ ගොඩනැගිල්ලේ හා ඉංජිනේරු පීඨය සඳහා ඉදිකරන ලද බහු කාර්යය ගොඩනැගිල්ලේ වහලවල තහඩු ප්‍රමිතියට අනුරූප නොමැති වීම නිසා භාවිතයට ගැනීමටත් ප්‍රථම සියලුම තහඩු ඉවත් කර නැවත තහඩු ඇතිරීමට ගොඩනැගිලි දෙක සඳහා එකතුව රු.14,056,253 ක අමතර වැයක් විශ්ව විද්‍යාලයට දැරීමට සිදු වී තිබුණි. මෙම මුදල උපදේශක සේවාව සැපයූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | කොන්ත්‍රාත් කරුවන්ගේ වැඩ සමීප අධීක්ෂණයට ලක්කර ප්‍රමිතියන්ට අනුව නිමකරවා ගැනීමට කටයුතු කිරීම හා මෙහි උපදේශක සේවාව සැපයූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැවති පුරප්පාඩු 190 සම්පූර්ණ කර නොගැනීම හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී රු.38,730,873 ක දීමනා ගෙවා තිබුණි. | අදාල තනතුරු සඳහා සුදුසුකම්ලත් ඉල්ලුම්කරුවන් ඉල්ලුම්කර නොමැති නිසා පුරප්පාඩු පිරවීමට නොහැකි වන අතර අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීමට සිදු වන බව. | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගගත යුතුය. |